ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුලි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) පහත සඳහන් නිරීක්ෂණය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවිය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපල පිරියත හා උපකරණවලට අදාලව ඉකුත් වර්ෂය අවසානයට පැවති අගයන් හා සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති අගයන් අතර රු.2,938,255,133 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2020 වර්ෂය තුලදී දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය විසින් මිලදී ගන්නා ලද මූල්‍ය නොවන වත්කම් සහ දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය විසින් 252-1-1-2102 හෝ 252-1-1-2103 වැය විෂයයන් යටතේ හැර අනෙකුත් මූලධන වැය විෂයයන් යටතේ දෙපාර්තමේන්තු පරිහරණය සඳහා මිලදී ගන්නා ලද රු. 23,599,984 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂයන් ලෙස ගිණුම් ගතකර ඇත. | ඉකුත් වර්ෂයේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශණවල සඳහන් වත්කම්වල ශේෂයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. එය වෙනස්වේ නම් ඒ බව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතු වීම. |

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මා විසින් කර තිබූ නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර තිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් 07 ක හා මූලධන වැය විෂයන් 09 ක් සඳහා එකතුව රු. මිලියන 394.87 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු. මිලියන 218.51 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 70.42 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | චක්‍රලේඛ සීමාවට අනුකූල වීම, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තු ලබාදීම ප්‍රමාද වීම, අක් මුදල් නොලැබීම, ප්‍රතිපාදන ලබාදීම වර්ෂය අවසානයේදී සිදුකිරීම යන කරුණු හේතු වූ බව. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් සලසා ගන්නා මූලධන ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අංක 252-1-8-2507(13) දරන වැය විෂයය යටතේ වෙන් කරන ලද රු. 1,273,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | **UNFPA** ආයතනය මඟින් ලබා දුන් මෙම ප්‍රතිපාදන කොවිඩ් වසනංගත තත්ත්වය හේතුවෙන් අමාත්‍යවරයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට නොහැකි වීම නිසා ඉතිරි වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් සලකා ගන්නා ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කළ යුතුය. |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1991 සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ සේවය අතහැර ගිය නිලධාරීන් 12 දෙනෙකුට අදාළ එකතුව රු. 553,207 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පදිංචි ස්ථානය සොයා ගැනීමට කටයුතු කරන බව හා නීතිපති මඟින් කටයුතු කරන බව. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01 පරිදි කටයුතු කළ යුතු බව. |
| (ආ) | මියගිය නිලධාරීන් 04 දෙනෙකුට අදාළව අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 165,450 විය. | රු.92,750 ක ණය ශේෂය සම්බන්ධයෙන් මරණ පිරිතෝෂිකය සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව, රු. 65,000ක ණය ශේෂය අයකර ගැනීම සඳහා මරණ පාරිතෝෂිකයේ වූ අඩුපාඩුවක් සකස් කර 2020.06.17 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අදාල ලිපි ලේඛන යොමු කර ඇත. | -එම- |
| (ඇ) | 2019 සැප්තැම්බර් මස විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 289,219 ක ණය ශේෂය 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | විශ්‍රාම පාරිතෝෂිතය ප්‍රදානය කිරීමෙන් පසු අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

2.3 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 02/2020 ප්‍රකාරව නිකුත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ මාර්ගෝපදේශයන් හි 3.4 ඡේදයේ උපදෙස්වලට පටහැනිව 2020 වර්ෂයට අදාල රු.822,836 ක බැරකම් 2021 වර්ෂයේ දී නිරවුල් කර තිබුණි. | එකඟ වෙමි. රු. 822,836 ක ගෙවීම් 2020 වර්ෂයේ බැරකම් ලෙස සටහන් කර නොමැති අතර එම ගෙවීම් සඳහා වවුචර්පත් 2021 වර්ෂයේ ලැබී ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) 2017 මැයි 04 දිනැති අංක 02/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු. 9,324,361 ක් වූ පොත්, සඟරා හා ලේඛනවලට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අදාළ චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු වීම. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාලීනවූත්, නිවැරදිවූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර විය. එහෙත් දෙපාර්තමේන්තුවේ දත්ත නිකුත් කිරීම් දින දර්ශනය අනුව දත්ත නිකුත් කිරීමට නියමිත දිනවලට වඩා මාස 01 සිට මාස 11 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී දත්ත නිකුත් කර තිබූ අවස්ථා 45 ක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | නියමිත දින වකවානු තුළ දත්ත නිකුත් කිරීමට කටයුතු කළ යුතු බව. |

**3.2. සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ තාක්ෂණික හා සේවා අංශ 15 ක් හා විශේෂ ඒකක 06 ක් මඟින් 2020 වසර තුළ අදාළ කාර්යයන් මෙහෙයවන ලද බව කාර්යය සාධන වාර්ථාවේ දන්වා ඇතත්, විශේෂ ඒකක යටතේ වන අන්තර්ජාතික සංඛ්‍යා ලේඛන ඒකකය, ගිණුම් අංශය, ප්‍රසම්පාදන අංශය හා අභ්‍යන්තර විගණන අංශයන් හි ක්‍රියාකාරකම් කාර්ය සාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වර්ෂය තුළ සාක්ෂාත් කර ගන්නා ලද සියලුම අංශවලට අදාළ කාර්යයසාධනයන්, කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළ යුතු වීම. |

**3.3 කාර්යභාරයන් ඉටුනොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අංශ 06 කට අදාළව ඉලක්ක ගත කාර්යයන් 08 ක කිසිදු කාර්ය සාධනයක් නොවීය. | අදහස් දක්වා නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු වීම. |
| (ආ) අංශ 03 ක ඉලක්ක ගත කාර්යයන් 06 ක සියයට 50 ක් හෝ ඊට අඩු ප්‍රගතියක් ලබා ගෙන තිබුණි. | -එම- | -එම- |

**3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**විදේශ ආධාර ලබන ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විදේශ ආධාර ව්‍යාපෘති යටතේ රු. මිලියන 130.16 ක් සඳහා ව්‍යාපෘති 06 ක් හඳුනා ගෙන තිබූ අතර එම ව්‍යාපෘති 2018 ජනවාරි මාසයේ ආරම්භ කර 2020 වර්ෂයේ අවසාන් කිරීම නියමිතව තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිවලින් කිසිවක් 2020 වර්ෂයේ දී අවසන් කිරීමට නොහැකිව තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගත යුතු වීම. |

## 3.5 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේෂය ප්‍රකාරව වර්ෂ 03 ක කාලයක් සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රධන ප්‍රසම්පාදන සැලැස්මක් සකසා නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පමණක් සකසා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අමතරව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහ අධීක්ෂණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තා මුද්‍රණය කිරීමේ වියදම් ද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තා මුද්‍රණ වියදම් ද සහ අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂ මුද්‍රණ වියදම් ද වශයෙන් බාහිර ආයතන වෙනුවෙන් දරන ලද මුද්‍රණ වියදම් ද දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් දරා තිබුණි | අදහස් දක්වා නොතිබුණි. | වෙනත් ආයතන වෙත සපයන ලද සේවාවන් සඳහා මුදල් අයකර ගත යුතු විය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 33 ක් හෙවත් පුරප්පාඩු 619 ක් පැවතුණි. ද්විතීයන පදනම මත මෙම දෙපාර්තමේන්තුවෙන් මුදා හරින ලද නිලධාරීන්ගේ සංඛ්‍යාව 03 දෙනෙකු වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය නිවැරදි ලෙස තක්සේරු කර ඇස්තමේන්තුවලට ඇතුළත් කර යුතු වීම. |
| (ආ) දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හතර දෙනෙකු අධ්‍යයන කටයුතු සඳහා මෙන්ම රැකියාවක නිරත වීම සඳහා විදෙශ ගත වී තිබුණ ද ඔවුන් අදාළ කාල සීමාව අවසානයේ දී නැවත සේවයට වාර්තා කර නොතිබුණි. ඔවුන්ගෙන් රජයට අයවිය යුතු වූ රු. 1,126,133 ක් වර්ෂ 03 සිට වර්ෂ 13 දක්වා වූ කාලයක සිට අය වී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තවද එක් නිලධාරියකු 2005 ජුනි 01 සිට 2006 දෙසැම්බර් 01 දක්වා ලබාගත් අධ්‍යයන නිවාඩු වෙනුවෙන් ගිවිසුමකට බැඳී නොතිබුණු අතර ඒ වෙනුවෙන් දණ්ඩන මුදලක් ද ගණනය කර නොතිබුණි. | | |
| (ඈ) | දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2018 ජනවාරි 24 දිනැති හා 02/2018 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛයේ සඳහන් පරිදි තොරතුරු ඇතුළත් කරමින් සකස් කළ යුතු වීම. |
| (ඇ) | ඉහත (ඈ) හි සඳහන් චක්‍රලේඛයේ **6.1** ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය **12** කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් **481** දෙනෙකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලබා දිය යුතු පැය ගණන සම්පූර්ණ කළ යුතු වීම. |